සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

| 25B | S | I |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

# First Term Test - Grade 12 - 2019

විභාග අංකය .............................

## යුරෝපා ඉතිහාසය I

කාලය පැය තුනයි
අමතර කියවීම් කාලය මිනි. 10 යි.

- මෙම කොටසේ ප්‍රශ්න 40ක් ඇත. සියලු ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ ඉන් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- **I** කොටසට පිලිතුරු ලියා අවසන් වූ පසු **II** කොටසේ පිළිතුරුපත් සමඟ අමුණා භාර දෙන්න.

### I කොටස

- **අංක 01 සිට 10 තෙක් ඇති ප්‍රශ්න සඳහා නාම / ස්ථාන 5 බැගින් දී ඇත. එයින් එකක් අනෙක් ඒවා සමඟ නොගැළපේ. නොගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය වරහන තුළ ලියන්න.**

01. 1. ඇතන්ස් 2. ස්පාටා 3. තීබ්ස් 4. කොරින්ත් 5. ක්‍රිමියා (.....)

02. 1. ඇල්ජීරියාව 2. මොරොක්කෝව 3. ලිබියාව 4. ජැමෙයිකාව 5. කොංගෝව (.....)

03. 1. ඇන්ගල්වරු 2. සැක්සන්වරු 3. පැට්‍රිෂියන්වරු 4. ෆ්‍රැන්ක්වරු 5. හන්වරු (.....)

04. 1. ජුපිටර් 2. මිනර්වා 3. මාර්ස් 4. සෙරෙස් 5. සියුස් (.....)

05. 1. ඇපනයින් 2. රොකී 3. පිරනීස් 4. කැන්ට්‍රිබියන් 5. ඇල්ප්ස් (.....)

06. 1. ෆීඩියාස් 2. මයිරන් 3. ඇනෙක්සිමැන්ඩර් 4. ඇනෙක්සිමීනීස් 5. ගොන්සාගා (.....)

07. 1. නීරෝ 2. ජස්ටිනියස් 3. ජූලියස් සීසර් 4. ඔගස්ටස්සීසර් 5. ඇලෙක්සැන්ඩර්(.....)

08. 1. හොරස් 2. ඔවිඩ් 3. ලිවි 4. ටැසිටස් 5. ඇලරික් (.....)

09. 1. ජිබෝල්ටා 2. බොස්පරස් 3. මැගලන් 4. ඩාඩනල්ස් 5. ඩෝවර් (.....)

10. 1. රාජාණ්ඩුව 2. කතිපයාධිපති ආණ්ඩුව 3. ප්‍රජා පීඩක පාලනය 4. අධිරාජ්‍යය 5. ප්‍රජාතන්ත්‍රවාදය (.....)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල නොගැළපෙන යුගල තෝරන්න.**

11. 1. සියුස් - ආකාශයට අධිපති දෙවියා
    2. ඇපලෝ - හිරු දෙවියා
    3. පොසයිඩන් - මුහුදට අධිපති දෙවියා
    4. සිනෝ - වයින්වලට අධිපති දෙවියා
    5. ඇෆ්‍රොඩයිට් - ආලයට අධිපති දෙවියා (.....)

12. 1. හෝමර් - වීර කාව්‍ය
    2. සොක්‍රටීස් - ජීව විද්‍යාව
    3. ඇරිස්ටෝටල් - තර්ක ශාස්ත්‍රය
    4. පයිතගරස් - ගණිතය
    5. හිපොක්‍රටීස් - වෛද්‍ය විද්‍යාව (.....)

13. 1. පෘතුගාලය - ලිස්බන්
    2. ස්පාඤ්ඤය - මැඩ්රිඩ්
    3. ඔස්ට්‍රියාව - බර්ලින්
    4. ප්‍රංශය - පැරිස්
    5. එංගලන්තය - ලන්ඩන් (.....)

14. 1. අරාබි - කඩදාසි නිෂ්පාදනය
    2. ග්‍රීක - නාට්‍ය කලාව
    3. රෝම - කොලෝසියම්
    4. ක්‍රිස්තියානි - බයිබලය
    5. යුදෙව් - ඉස්ලාම් දහම (.....)

15. 1. මධ්‍යධරණී මුහුද හා රතු මුහුද - සූවස් ඇල
    2. උතුරු මුහුද හා බෝල්ටික් මුහුද - කීල් ඇල
    3. ස්පාඤ්ඤය හා මොරොක්කෝව - ජිබෝල්ට්‍රා සමුද්‍ර සන්ධිය
    4. කළු මුහුද හා කැස්පියන් මුහුද - මලක්කා සමුද්‍ර සන්ධිය
    5. එංගලන්තය හා ප්‍රංශය - ඉංග්‍රීසි ඕඩය (.....)

- **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල X තීරුව සමග Y තීරුව ගළපන්න.**

16.

| | X | | Y |
|---|---|---|---|
| 1. | රුමේනියාව | A | ඔස්ලෝ |
| 2. | හංගේරියාව | B | බ්‍රසල්ස් |
| 3. | නොර්වේ | C | බුඩාපෙස්ට් |
| 4. | බෙල්ජියම | D | වෝර්සෝ |
| 5. | පෝලන්තය | E | බුකරෙස්ට් |

1. CDEAB 2. BDECA 3. DBACE 4. AEBDC 5. ECABD (.....)

17.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ශුද්ධ වූ කුරාණය | A | කවපෙත්ත විසිකරන්නා |
| 2. | බයිබලය | B | පාතීනන් දෙවි මැදුර |
| 3. | මයිරන් | C | ක්‍රිස්තියානි ආගම |
| 4. | ඇතන්ස් | D | ඇකඩමිය |
| 5. | ප්ලේටෝ | E | ඉස්ලාම් ආගම |

1. CAEBD 2. DCAEB 3. ACEBD 4. DCABE 5. ECABD (.....)

18.

| | X | | Y |
|---|---|---|---|
| 1. | නිකලස් කොපර්නිකස් | A | පරිනාමවාදී න්‍යාය |
| 2. | අයිසැක් නිව්ටන් | B | රේඩියම් සොයා ගැනීම |
| 3. | චාල්ස් ඩාවින් | C | සූර්ය කේන්ද්‍රීය වාදය |
| 4. | මාරි කියුරි | D | සාපේක්ෂතාවාදී න්‍යාය |
| 5. | ඇල්බට් අයින්ස්ටයින් | E | ගුරුත්වාකර්ෂණය පිළිබඳ න්‍යාය |

1. DCEAB 2. CEABD 3. DEACB 4. BEACD 5. EDACB (.....)

19.

| | X | | Y |
|---|---|---|---|
| 1. | මැසසියෝ | A | අවසාන විනිශ්චය |
| 2. | බොට්ටිචෙලි | B | ඇතැන්ස් හි පාසල |
| 3. | ලියනාඩෝ ඩාවින්චි | C | වීනස්ගේ උපත |
| 4. | මයිකල් ආංජිලෝ | D | ආදම් හා ඒව උද්‍යානයෙන් නෙරපීම |
| 5. | රෆායල් | E | අවසාන රාත්‍රී භෝජන සංග්‍රහය |

1. DCEAB 2. CEABD 3. DEACB 4. BEACD 5. EDACB (.....)

20.

| | X | | Y |
|---|---|---|---|
| 1. | පාර්තිනොන් | A | මොස්කව් |
| 2. | කොලෝසියම් | B | පැරිස් |
| 3. | ශාන්ත පීටර් බැසිලිකාව | C | රෝමය |
| 4. | ක්‍රෙම්ලින් | D | ඇතන්ස් |
| 5. | අයිෆල් කුලුන | E | වතිකානුව |

1. DCEAB 2. CEABD 3. DEACB 4. BEACD 5. EDACB (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. ජාතික රාජ්‍යයක ප්‍රධාන අංග,
 1. ශක්තිමත් ස්ථාවර හමුදාව 2. දුර්වල රාජාණ්ඩුව 3. ශක්තිමත් මධ්‍යම ආණ්ඩුව
 4. නිශ්චිත දේශසීමාව 5. ජාතික එක්සත් බව (.....)

22. වැඩවසම් ක්‍රමය,
 1. බල විකේන්ද්‍රගතව පැවතීම 2. ප්‍රවේණි ක්‍රමය 3. සාමුහිකත්වය
 4. රදල පන්තියේ බලය 5. ආගමික ගැටීම් (.....)

23. ප්‍රංශය ජාතික රාජ්‍යයක් වීම.
 1. නවාර් හෙන්රි කතෝලික ආගම වැලඳ ගැනීම.
 2. නැන්ටීස් ආඥා මඟින් හියුගනෝවරුන්ට ආගමික නිදහස ලබාදීම.
 3. ෆර්ඩිනන්ඩ් කුමාරයා හා ඉසබෙලා කුමරිය අතර විවාහය.
 4. හියුගනෝවරුන්ගේ බලය මෙල්ල කිරීම.
 5. ප්‍රාදේශීය පාලනය සඳහා ''ඉන්ටෙන්ඩාන්ට්'' වරු පත් කිරීම. (.....)

24. පුනරුදය
 1. ඉතාලි ප්‍රාදේශීය පාලකයන්ගේ සහය ලැබීම.
 2. මානවවාදී පාප්වහන්සේලාගේ අනුග්‍රහය ලැබීම.
 3. ඉතාලිය තුළ ග්‍රීක රෝම සංස්කෘතියේ ශේෂයන් පැවතීම.
 4. ගොතික් සම්ප්‍රදායේ දියුණුව.
 5. ස්වයංපෝෂිතභාවය බිඳ වැටීම. (.....)

25. මධ්‍යම පන්තියේ නැඟීම,
 1. මුදල් පරිහරණය වැඩිවීමත් සමග ධනය උපයාගත් නව මධ්‍යම පන්තියක් බිහිවිය.
 2. වංශාධිපතීන්ගේ බලය වර්ධනය විය.
 3. රජවරුන්ගේ උපදේශකයන් ලෙස පත්විය.
 4. සමාජයේ උසස් පිරිසක් බවට පත්විය.
 5. මනා අධ්‍යාපනයක් ලබාගත් පිරිසක් විය. (.....)

- **26 - 30 තෙක් ප්‍රශ්න සඳහා A B C හා D යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

  **A සහ B පමණක් නිවැරදි නම් අංක 1 ද**  **B හා C පමණක් නිවැරදි නම් අංක 2 ද**

  **C හා D පමණක් නිවැරදි නම් අංක 3 ද**  **A හා C පමණක් නිවැරදි නම් අංක 4 ද**

  **ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි ගණනක් නිවැරදි නම් අංක 5 ද අදාළ හිස්තැනෙහි ලියන්න.**

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | A සහ C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. ග්‍රීක ශිෂ්ටාචාරයේ පෞර රාජ්‍යවල ලක්ෂණ කවරේද ?
    A) ඇතන්ස් හා ස්පාර්ටා විශාල පෞර රාජ්‍ය වීම.
    B) ස්ත්‍රීන් හා පුරුෂයන් පුරවැසියන් ලෙස සැලකීම.
    C) සෑම පෞර රාජ්‍යකටම අධිපති දෙවියෙකු සිටීම.
    D) ඉතා විශාල භූමිභාගයකින් සමන්විත වීම. (.....)

27. රෝම සාහිත්‍යයේ ලක්ෂණ මොනවා ද ?
    A) ප්‍රධාන භාෂා මාධ්‍ය ඉංග්‍රීසිය
    B) පෙරික්ලීස් පාලන සමය රෝම සාහිත්‍යයේ දියුණු යුගයයි
    C) පුවත්පත් මගින් ජනතාවට තොරතුරු දැනුම් දුනි
    D) පොත් බැඳීමේ ක්‍රමය ආරම්භ විය (.....)

28. ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයෙන් යුරෝපය ලද දායාද මොනවා ද ?
    A) ශුද්ධ රෝම අධිරාජ තනතුර බිහිවිය.
    B) යුරෝපා සමාජයට සංවිධානාත්මක ආගමක් ලැබීම.
    C) කලා නිර්මාණවලට කිතු දහමේ බලපෑම් ලැබීම.
    D) ක්‍රිස්තු සභාව සමාජය මෙහෙයවන ප්‍රධාන බලවේගය වීම. (.....)

29. වැඩවසම් ක්‍රමය පරිහානියට බලපෑ හේතු මොනවා ද ?
    A) කුරුස යුද්ධය.  B) වෙළඳාමේ දියුණුව.
    C) විප්ලවීය අදහස් පැතිර යාම.  D) මිලේච්ඡ ආක්‍රමණය. (.....)

30. ස්පාඤ්ඤය ජාතික රාජ්‍යයක් වීමේ පියවර මොනවා ද ?
    A) පොදු නීති පද්ධතියක් රටතුල ක්‍රියාත්මක කිරීම.
    B) පළමුවන චාල්ස් රජුට ශුද්ධ රෝම අධිරාජ්‍ය තනතුර ලැබීම.
    C) දෙවන හෙන්රි රජු පොදු නීති පද්ධතියක් ආරම්භ කිරීම.
    D) මිලේච්ඡ ආක්‍රමණ (.....)

- **අංක 31 - 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. පුරාණ රෝම රඟමඩල කුමක් ද ?
    1. පාර්තිනොන් 2. සියුස් දෙවොල 3. කොලෝසියම්
    4. බැසිලිකාව 5. වතිකානුව (.....)

32. පුරාණ රෝම අධිරාජයා කවු ද ?
    1. ක්ලිස්තිනිස් 2. ජස්ටීනියන් 3. අවුරේලියස් 4. ගැලේරියස් 5. නීරෝ (.....)

33. රුධිර සංසරණ ක්‍රමය සම්පූර්ණයෙන් සොයා ගත්තේ කවු ද ?
    1. පැරසල්සස් 2. විලියම් හාර්වේ 3. මයිකල් සර්වේට්ස්
    4. අයිසෙක් නිව්ටන් 5. අල්රාසි (.....)

34. ඊනිඩ් කෘතියේ ලේඛකයා කවු ද ?
    1. වර්ජිල් 2. හොරේස් 3. ලිවී 4. ඔවිඩ් 5. සිසරෝ (.....)

35. මුස්ලිම් අධිරාජ්‍යයේ වැදගත් වෙළඳ මධ්‍යස්ථානයක් වන්නේ කුමක් ද ?
    1. සමාරා 2. බැග්ඩෑඩ් 3. ග්‍රැනඩා
    4. ෆ්ලොරන්ස් 5. කොන්ස්තන්තිනෝපලය (.....)

- **අංක 36 - 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවෙහි. දැක්වෙන 1,2,3,4,5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදිය | නිවැරදිය |
| 2. | නිවැරදිය | වැරදිය |
| 3. | වැරදිය | නිවැරදිය |
| 4. | වැරදිය | වැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදාදෙයි. |
| | | |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 36. මිනෝවන් හා මයිසීනියන් ශිෂ්ටාචාර යුරෝපයේ පැරණිම ශිෂ්ටාචාර වේ. | ෆිනීෂියාව හා බැබිලෝනියාව වැනි ශිෂ්ටාචාරවල නගර රාජ්‍යයන් පැවත ඇත. (.....) |
| 37. රෝමවරු ග්‍රීක ශිෂ්ටචාරයෙන් ආභාසය ලැබූහ. | ග්‍රීකයන්ගේ විද්‍යාත්මක චින්තනය සාහිත්‍ය, දර්ශනය හා භූගෝල විද්‍යාව පිළිබඳ දැනුම ලබාගත් රෝමවරු එහි ප්‍රතිඵලයක් ලෙස මානව බුද්ධිය අගය කිරීමටද පටන් ගත්හ. (.....) |
| 38. ඇතීනා දෙවගන වෙනුවෙන් ඇක්‍රොපොලිස්හි දෙවස්ථානය ඉදි කර ඇත. | ප්ලේටෝගේ ලියිසියම් නම් වැදගත් අධ්‍යාපන ආයතනයක් විය. (.....) |
| 39. පෙලපොනීසියානු යුද්ධය නම් කෘතියේ කතෘ තියුසිඩියස්ය. | නයිට්‍රික් අම්ලය, සල්ෆියුරික් අම්ලය රෝමානුවන්ගෙන් යුරෝපයට ලැබුණි. (.....) |
| 40. 1553 දී තුර්කීන් විසින් කොන්ස්තන්තිනෝපලය අල්ලා ගන්නා ලදී. | 14 ලුවී රජු විසින් පැරිස් නගරය ප්‍රංශ සභ්‍යත්වයේ අලංකාර මධ්‍යස්ථානය බවට පත් කරන ලදී. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

25B | S | II

පළමු වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**First Term Test - Grade 12 - 2019**

විභාග අංකය ............................ යුරෝපා ඉතිහාසය II

- **පළමුවන ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා යුරෝපයේ දළ ආකෘති සිතියමක් සපයා ඇත.**

01. ඔබට සපයා ඇති සිතියමෙහි පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.
(i) ප්‍රංශය (ii) පිරනීස් කඳු (iii) පෝලන්තය (iv) රෝමය
(v) ඇතැන්ස් (vi) ඉතාලිය (vii) එංගලන්තය (viii) ලිවර්පූල්
(ix) බිස්කේ බොක්ක (x) උතුරු මුහුද (xi) නාගුස් ගඟ (xii) ජිබෝල්ට්‍රා සමුද්‍ර සන්ධිය (ල. 12)

02. ''යුරෝපා ශිෂ්ටාචාරය ගොඩනැඟීමෙහිලා බලපෑ ප්‍රබල සාධක අතර, ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලද පදනම සුවිශේෂී වේ. ''
(i) ග්‍රීක පෞර රාජ්‍යයන් 2ක් නම් කරන්න. (ල. 2)
(ii) පෘථිවියේ නිර්මාණය පිළිබඳව අදහස් දැක්වූ මුල්ම ග්‍රීක දාර්ශනිකයින් තිදෙනෙකු නම් කරන්න. (ල. 3)
(iii) ග්‍රීක සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ල. 11)

03. (i) කුඩා ලතින් රාජ්‍යක සිට විශාල අධිරාජ්‍යයෙන් දක්වා රෝම බල ව්‍යාප්තියේ ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න. (ල. 8)
(ii) රෝමානුවන්ගේ ආගම පිළිබඳව විමසීමක් කරන්න. (ල. 8)

04. (i) ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයෙන් යුරෝපය ලද දායාද මොනවා ද ? (ල. 8)
(ii) ඉස්ලාම් ශිෂ්ටාචාරයෙන් යුරෝපය ලද දායාද මොනවා ද ? (ල. 8)

05. (i) යුරෝපයේ මධ්‍යතන යුගයේ පැවති වැඩවසම් ආර්ථික හා සමාජ ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ ගෙන හැර දක්වන්න. (ල. 7)
(ii) වැඩවසම් ආර්ථික හා සමාජ ක්‍රමය පරිහානියට පත්වූ අයුරු පරීක්ෂා කරන්න. (ල. 9)

06. ''මධ්‍යතන යුරෝපය නූතන යුරෝපය බවට පත් කළ සන්ධිස්ථානය පුනරුදයයි.''
(i) පුනරුදය යනු කුමක්දැයි කෙටියෙන් අර්ථ දක්වන්න. (ල. 2)
(ii) පුනරුදය ඇතිවීමට තුඩුදුන් සාධක මොනවා ද ? (ල. 6)
(iii) නූතන යුරෝපයේ ආරම්භයේ ඇති වූ දේශපාලන, සමාජ, ආර්ථික වෙනස්කම් ඇසුරෙන් ඉහත සඳහන් ප්‍රකාශය පරීක්ෂා කරන්න. (ල. 8)

07. ''ස්පාඤ්ඤය හෝ ප්‍රංශය හෝ ජාතික රාජ්‍යයක් ලෙස වර්ධනය වූ ආකාරය පැහැදිලි කරන්න. (ල. 16)

08. පහත සඳහන් මාතෘකා අතරින් 2ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
(i) පුරාණ රෝම කලාව හා සාහිත්‍ය
(ii) එංගලන්තය ජාතික රාජ්‍යක් වීම
(iii) පුනරුද සමයේ විද්‍යාව හා වෛද්‍ය විද්‍යාවේ ඇති වූ ප්‍රබෝධය
(iv) ඉතාලියෙන් පුනරුදය ආරම්භ වීම.

## පළමු වාර පරීක්ෂණය 2019 - යුරෝපා ඉතිහාසය - පිළිතුරු
## 12 ශ්‍රේණිය - I කොටස

| | | | |
|---|---|---|---|
| **01.** - 5 | **11.** - 4 | **21.** - 2 | **31.** - 3 |
| **02.** - 4 | **12.** - 2 | **22.** - 5 | **32.** - 4 |
| **03.** - 3 | **13.** - 3 | **23.** - 3 | **33.** - 1 |
| **04.** - 5 | **14.** - 5 | **24.** - 4 | **34.** - 1 |
| **05.** - 2 | **15.** - 4 | **25.** - 2 | **35.** - 2 |
| **06.** - 5 | **16.** - 5 | **26.** - 4 | **36.** - 1 |
| **07.** - 5 | **17.** - 5 | **27.** - 3 | **37.** - 5 |
| **08.** - 5 | **18.** - 2 | **28.** - 5 | **38.** - 4 |
| **09.** - 3 | **19.** - 1 | **29.** - 1 | **39.** - 2 |
| **10.** - 4 | **20.** - 1 | **30.** - 1 | **40.** - 3 |

## II කොටස

01.



සිතියමෙහි අදාළ ස්ථාන ලකුණු කොට නම් කරන්න. (ල. 12)

02. (i) ඕනෑම පෞර රාජ්‍යයන් දෙකක් ලියා ඇතිවිට ලකුණු ලබා දෙන්න. (ල. 2)
(ii) තේලිස්, එම්පරඩොලස්, ඇනෙක්සිමීනීස්, ඇනෙක්සි මැන්ඩර් (ල. 3)
(iii) ආගම, කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය, සාහිත්‍ය, දර්ශනය පිළිබඳව උදාහරණ සහිතව ලියා ඇතිවිට ලකුණු ලබා දෙන්න. (ල. 11)

03. (i) මධ්‍යම ඉතාලියේ ටයිබර් ගං මෝයට ආශ්‍රිතව රෝමය ආරම්භ වීම.
* එට්‍රස්කන්වරුන්ගේ ආධිපත්‍යයට යටත් වීම.
* රෝම සමූහාණ්ඩුව පිහිටුවීම.
* කාර්තේජය සමග කළ පියුනික් යුද්ධ
* දෙවන පියුනික් යුද්ධය. (ල. 8)

(ii) බහු දේවවාදය පිළිබඳව තොරතුරු සඳහන් කරන්න.
* භූතාත්ම වන්දනා කිරීම.
* මව් දෙවඟනට පුද පූජා පැවැත්වීම.
* අධිරාජ්‍යයා වන්දනය
* ක්‍රිස්තියානි ආගම නීත්‍යානුකූල ආගමක් වීම හා රාජ්‍යාගම බවට පත්වීම. (ල. 8)

04. (i)
* ප්‍රථම සංවිධානාත්මක ආගම වන ක්‍රිස්තියානි ආගම යුරෝපයේ ප්‍රධානම ආගම වීම.
* යුරෝපයේ ප්‍රධානම ආගම වීම.
* ශුද්ධ රෝම අධිරාජ්‍ය තනතුර ලැබීම.

* යුරෝපා සමාජයට සංවිධානාත්මක ආගමක් ලැබීම. * පාප් තනතුර බිහිවීම.
* මිෂනාරීන් විසින් කිතුදහම ව්‍යාප්ත කිරීම.
* ම්ලේච්ඡ ආක්‍රමණ වලින් ජනතාව හා පැරණි සංස්කෘතිය ආරක්ෂා කිරීම.
* ක්‍රිස්තු සභාව අධ්‍යාපනය මෙහෙයවන ප්‍රධාන ආයතනය වීම.
* කිතුදහමට යොමුවූ කලා නිර්මාණය බිහිවීම.
* දේශපාලන ක්ෂේත්‍රයේදී දේව වරම්වාදී අදහස් ඉදිරිපත් විය. (ල. 8)

(ii)
* උසස් අධ්‍යාපන ක්‍රමය. * විශ්ව විද්‍යාල බිහිවීම.
* ලෝක සාහිත්‍යයට බලපෑමක් කළ සාහිත්‍ය කෘති බිහිවීම * වෛද්‍ය විද්‍යාව හා විද්‍යා දැනුම
* වෙළඳාම * කලාව හා ගෘහ නිර්මාණ ශිල්පය

මේවා උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 8)

05. (i) **ආර්ථික**
* කෘෂිකර්මය පදනම් කරගත් ආර්ථිකය * ප්‍රධාන ආර්ථික ඒකකය ප්‍රවේණිය / බණ්ඩාරගම
* ස්වයංපෝෂිත බව / වෙළඳාම හා මුදල් භාවිතය සීමා වීම. * රටේ භූමියේ හිමිකරු රජුවීම.
* රජු - රදළ - ප්‍රවේණි දාස සේවා සම්බන්ධතාවය. * පල්ලිය වෙත සේවාවන් හා බදු ගෙවීමට බැඳී සිටීම.
* ශ්‍රේණි ක්‍රමයක් ක්‍රියාත්මක වීම. මේවා උදාහරණ සහිතව විස්තර කරන්න.

**සමාජ**
* රදළ හා ප්‍රවේණිදාස පන්තිය * සමාජ තරාතිරම උත්පත්තිය මත තීරණය වීම
* රදළ ප්‍රභූ පන්තිය වරප්‍රසාද භුක්ති විඳීම * සාමූහික ජීවන රටාව (ල. 7)

(ii)
* වෙළඳාම පුළුල් වීම. * මුදල් භාවිතය පැතිර යාම.
* නගර බිහිවීම. * ඉඩම් භුක්තිය මත රුදුනු සේවා සම්බන්ධතාවය බිඳ වැටීම.
* උපත වෙනුවට ධනය වැදගත් වීම. * පුද්ගලිකත්වය හා තරගකාරීත්වය නැගී ඒම. (ල. 9)

06. (i) ග්‍රීක රෝම ශිෂ්ටාචාර යළි පිබිදීම තුලින් යුරෝපයේ දේශපාලන, සමාජ, ආර්ථික, සංස්කෘතික අංශවල පුළුල් ප්‍රබෝධයක් ඇතිවීම. (ල. 2)

(ii)
* 1453 දී තුර්කීන් විසින් කොන්ස්තන්තිනෝපලය අල්ලා ගැනීම. * වෙළඳාමේ දියුණුව.
* වැඩවසම් ක්‍රමය පිරිහීම. * ග්‍රීක රෝම සංස්කෘතික අංශවල ශේෂයන් පැවතීම.
* මුදල් භාවිතය පැතිර යාම. * දේශ ගවේෂණ ව්‍යාපාරය. (ල. 6)

(iii)
* පුනරුදයෙන් දේශපාලන, සමාජ ආර්ථික ක්ෂේත්‍රවල ඇතිවූ වෙනස්කම් උදාහරණ සහිතව දක්වන්න. (ල. 8)

07. අදාල පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ල. 16)

08. අදාල පිළිතුරට ලකුණු ලබා දෙන්න. (ල. 8 x 2 = ල. 16)


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
GUIDE PAST PAPERS
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440